සැ. යු. - 2023.03.31 දින පළ වූ අංක 2326 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,327 - 2023 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2023.04.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 548 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 අප්‍රේල් මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


547 - B 82444 — 5,403 (2023/04)

# පළාත් පාලන නිවේදන

## පානදුර ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පහත දක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "මහාචාර්ය ගුණපාල මලලසේකර මාවත" ලෙස නම් කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්ලිව්. හේමන්ත ප්‍රනාන්දු,
සභාපති,
පානදුර ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පාළාත් පාලන අමාත්‍යාංශයේ නම | : | බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය |
| 2. | පළාත් පාලන ආයතනයේ නම | : | පානදුර ප්‍රාදේශීය සභාව |
| 3. | දිස්ත්‍රික්කය | : | කළුතර |
| 4. | යොදා ඇති නම | : | මහාචාර්ය ගුණපාල මලලසේකර මාවත |
| 5. | මාර්ග විස්තරය | : | පානදුර ප්‍රාදේශීය සභාවේ තන්තිරිමුල්ල උප කාර්යාල බල ප්‍රදේශයේ අංක 684/ඒ නැමැති ග්‍රාම සේවා වසමේ බටහිර මාලමුල්ල ග්‍රාමයේ පානදුර සිට මාලමුල්ල යන ප්‍රධාන පාරින් ආරම්භ වී අංක 103/3 දරන පුද්ගලික ඉඩමෙන් අවසන් වන මීටර් 265 ක ප්‍රමාණයෙන් දිගින් යුත් මීටර් 3.35 හා මීටර් 5.2 දක්වා පළලින් යුත් පාර. |

04-28

---

## මහනගර සභාව - යාපනය

අය වැය - 2023

යාපනය මහනගර සභාවේ 2023 වර්ෂය සඳහා අයවැය (කෙටුම්පත) 2023.03.23 සිට 2023.03.29 දක්වා

- යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- යාපනය මහ නගර සභාව - මහජන සම්බන්ධතා සේවාව
- යාපනය මහජන පුස්තකාලය
- නවීන වෙළඳ පොළ - පාරිභෝගික සේවා ස්ථානය

යන ස්ථාන වල මහජන දර්ශනය සඳහා තබා ඇත. මහජනතාව මෙම කෙටුම්පත් අයවැය සලකා බලා වඩාත් ප්‍රගතිශීලී අයවැයක් සඳහා වන තම අදහස් හා යෝජනා 2023.03.29 වැනි දිනට පෙර යාපනය මහ නගර සභා ලේකම් කාර්යාලයට ලිඛිතව දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිමි.

ඉ. ත. ජෙයසීලන්,
කොමසාරිස්,
මහ නගර සභාව,
යාපනය.

2023 ක් වූ මාර්තු මස 23 වැනි දින.

04-32

## ඇඹිලිපිටිය නගර සභාව

### ප්‍රධාන මාර්ගය දෙපස ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට වාහන නතර කිරීම සම්බන්ධ තීරණය දැනුම් දීම

2009 අංක 08 දරන මෝටර් වාහන පනතේ අංක 166 (1) (අ) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ප්‍රධාන මාර්ගය දෙපස ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට වාහන නතර කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2023 ක් වූ මාර්තු මස 17 වැනි දින පවත්වන ලද ඇඹිලිපිටිය නගර සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 11 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. පී. දිනේෂ් මධුෂංක,
සභාපති,
ඇඹිලිපිටිය නගර සභාව.

2023 ක් වූ මාර්තු මස 17 වැනි දින,
ඇඹිලිපිටිය නර සභා කාර්යාලයේ දී.

**යෝජනාව**

2022.03.28 දිනැති රථ වාහන කමිටුවේ නිර්දේශය පරිදි 2023.04.01 දින සිට,

- ඔරලෝසු කණුව අසල සිට මොරකැටියට හැරෙන හන්දිය දක්වා මාර්ගය
- මොරකැටියට හැරෙන හන්දියේ සිට කාවන්තිස්ස පන්සල දක්වා මාර්ගය
- ප්‍රධාන බස්නැවතුම්පල අසල සිට මහජන බැංකුව දක්වා මාර්ගය
- මොරකැටියට හැරෙන හන්දියේ සිට රත්නවීර ඉන්ධන පිරවුම්හල දක්වා මාර්ගයන්හි

පෙ. ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා කාලය තුළ ඔත්තේ දිනවල මාර්ගයේ වම්පස ද ඉරට්ටේ දිනවල මාර්ගයේ දකුණු පස ද වාහන නැවැත්වීම සුදුසු යැයි යෝජනා කරමි.

04-42

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| අප්‍රේල් | 2023.04.06 | බ්‍රහස්පතින්දා | 2023.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.04.12 | බදාදා | 2023.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.04.21 | සිකුරාදා | 2023.04.06 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.04.28 | සිකුරාදා | 2023.04.12 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2023.05.04 | බ්‍රහස්පතින්දා | 2023.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.05.12 | සිකුරාදා | 2023.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.05.19 | සිකුරාදා | 2023.05.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.05.26 | සිකුරාදා | 2023.05.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2023.06.02 | සිකුරාදා | 2023.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.06.09 | සිකුරාදා | 2023.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.06.16 | සිකුරාදා | 2023.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.06.23 | සිකුරාදා | 2023.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.06.30 | සිකුරාදා | 2023.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.